මගේ අංකය :- අධිසේකොස/කඩඉම්(පැරණි)/2021

සියලුම
මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්/ මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ / අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

**උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ ලඝු ලේඛක II ශ්‍රේණියේ නිලධරයන් සඳහා වූ දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020 (පැරණි ව්‍යවස්ථාව අනුව)**

අංක 224/15 හා 1982 දෙසැම්බර් මස 23 දින දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ II වන කොටසේ 10 වන වගන්තියේ (IV) (අ) සහ (ආ) උප වගන්ති වලට සහ කලින් කලට අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ගන්නා ලද තීරණවලට අනුකූලව "ට" පරිශිෂ්ඨයෙහි දැක්වෙන රෙගුලාසි හා නිර්දේශ පත්‍රයට අනුව අධිකරණ ලඝු ලේඛක II වන ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යය වලින් කොළඹ දී පැවැත්වීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

- ❖ උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ ලඝු ලේඛක II ශ්‍රේණියේ I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කරන ලද නිලධරයන් පමණක් මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුස්සෝ වෙති.

02. **විභාගයේ විෂයය:**

01. ලඝු ලේඛනය හා යතුරු ලියනය
02. සම්මේලනයක් වාර්තා කිරීම

03. **විභාග පටිපාටිය:**

(I) සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් සේවයට බඳවාගෙන ඇති නිලධරයන් විනාඩියකට වචන 85 ක වේගයෙන් කියවනු ලබන පාඨයක් ලඝු ලේඛනය කර එය විනාඩියකට වචන 08 ක වේගයෙන් යතුරු ලියනය කිරීම.

(II) ඉංග්‍රීසි මාධ්‍යයෙන් සේවයට බඳවාගෙන ඇති නිලධරයන් විනාඩියකට වචන 120 ක වේගයෙන් කියවනු ලබන පාඨයක් ලඝු ලේඛනය කර එය විනාඩියකට වචන 10 ක වේගයෙන් යතුරු ලියනය කිරීම.

04. මෙම විභාගයේ යතුරු ලියන පරීක්ෂණය පරිගණක භාවිතා කරමින් පැවැත්වීමට තීරණය කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය පරිගණක යන්ත්‍ර සපයනු ලැබේ.

05. සිංහල මාධ්‍යය අයදුම්කරුවන්ට තම අභිමතය පරිදි පහත සඳහන් අක්ෂර ක්‍රම (Font) වලින් එකක් භාවිතා කරමින් යතුරු ලියන පරීක්ෂණයට පෙනී සිටීමට අවස්ථාව සලසා ඇත.

i. Sandaya BOI
ii. Su-VijayaO
iii. Iskoola Pota

06. දෙමළ මාධ්‍යය අයදුම්කරුවන්ට තම අභිමතය පරිදි පහත සඳහන් අක්ෂර ක්‍රම (Font) වලින් එකක් භාවිතා කරමින් යතුරු ලියන පරීක්ෂණයට පෙනී සිටීමට අවස්ථාව සලසා ඇත.

i. Sharukeshi
ii. Kalaham
iii. Latha

07. ඉංග්‍රීසි මාධ්‍යය අයදුම්කරුවන්ට පහත සඳහන් අක්ෂර ක්‍රමය (Font) භාවිතා කරමින් යතුරු ලියන පරීක්ෂණයට පෙනී සිටීමට අවස්ථාව සලසා ඇත.

i. Times New Roman

08. ලඝු ලේඛනය හා යතුරු ලියනය කිරීම සම්බන්ධ පරීක්ෂණයෙන් අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබාගන්නා අපේක්ෂකයින්ට පමණක් සම්මේලනයක් වාර්තා කිරීමේ පරීක්ෂණයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

09. පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධරයන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතකුදු වුවත් ඉන්පසු වාර වලදී නිලධරයන් විසින් සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම් හෝ එක් විෂයකට වඩා පෙනී සිටින්නේ නම් රු. 500/- ක් ද, එක් විෂයක් සඳහා පෙනී සිටින්නේ නම් රු. 250/- ක් ද විභාග ගාස්තු වශයෙන් ගෙවිය යුතුය. (සටහන බලන්න) මීට ප්‍රථම මෙම විභාගය සඳහා ඉල්ලුම් කර ඉදිරිපත් නොවූ නිලධරයන් දෙවන වතාවට ඉදිරිපත් වන සේ සලකා විභාග ගාස්තු ගෙවා විභාගයට අයදුම් කළ යුතුය. කවර කරුණක් යටතේ වුවද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩදෙනු නොලැබේ.

10. මෙම විභාග ගාස්තු **අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්** නමින් මහජන බැංකුව, වෙල්ල වීදිය ශාඛාවේ පවත්වාගෙන යන ගිණුම් අංක **297100199025039** ට බැර කර ලබා ගන්නා ලදුපත අයදුම් පත්‍රයේ අලවා එවිය යුතුය.

11. මේ සමඟ ඇති ආකෘති පත්‍රයට අනුව 11 ½ " X 8 ½ " ප්‍රමාණයේ සන කඩදාසියේ සකස් කොට සම්පූර්ණ කරන ලද අදාල නිලධරයන්ගේ අයදුම්පත්‍ර ඔබේ නිර්දේශය සමග **2023 ජනවාරි 31** වන දිනට හෝ එදිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් මෙම කාර්යාලයට එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **" අධිකරණ ලඝු ලේඛක II ශ්‍රේණියේ නිලධරයන් සඳහා වූ දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020 (පැරණි ව්‍යවස්ථාව අනුව)"** යනුවෙන් සඳහන් කළ යුතුය.

12. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර හා නිසි අයුරින් සම්පූර්ණ නොකළ අයදුම්පත්‍ර ද කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

13. මෙම ලිපිය ඔබ අධිකරණයේ සියලුම නිලධාරීන්ට දැන්වීමට කටයුතු කරන්න.

සටහන :- **2018.09.11 දිනැති උපලේඛනගත රජයේ නිලධරයන්ගේ ව්‍යවස්ථා සංග්‍රහයේ 15.3.2 හා 15.3.3 වගන්ති පහත පරිදි වේ.**

**15.3.2 "මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමට පෙර පැවති සේවා ව්‍යවස්ථාව යටතේ අධිකරණ ලිපිකරු, අධිකරණ භාෂණ පරිවර්තක, අධිකරණ ලඝු ලේඛක සහ අධිකරණ යතුරු ලේඛක සේවාවල II ශ්‍රේණියට අදාල වන පළමු වන හා දෙවන වන කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්පූර්ණ කරන ලද නිලධරයන් මෙම සේවා ව්‍යවස්ථාව යටතේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ (අධිකරණ ලිපිකරු, අධිකරණ භාෂණ පරිවර්තක, අධිකරණ ලඝු ලේඛක සහ අධිකරණ යතුරු ලේඛක සේවාවන්ට අයත්) II ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්/නිදහස් වූවා ලෙස සැලකේ."**

15.3.3 "නියමිත දිනට පළමුවන හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්පූර්ණ නොකරන ලද අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ (අධිකරණ ලිපිකරු, අධිකරණ භාෂණ පරිවර්තක, අධිකරණ ලඝු ලේඛක සහ අධිකරණ යතුරු ලේඛක) II වන ශ්‍රේණියේ නිලධරයන්ට පැරණි ව්‍යවස්ථාව යටතේ කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට පෙනී සිටීම සඳහා නියමිත දින සිට වසර තුනක සහන කාලයක් ලබා දෙනු ලැබේ. එම කාලය තුළ අදාල පළමු වන හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාග දෙක සමත් වී/නිදහස් වී සම්පූර්ණ කර ගැනීමට අපොහොසත් වන නිලධරයන් එක් කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් හෝ එකී විභාගවල එක් විෂයක් හෝ විෂයයන් කීපයක් සමත් වී තිබුණද, මෙම ව්‍යවස්ථාව යටතේ අධිකරණ කළමනාකරණ සේවයේ (අධිකරණ ලිපිකරු, අධිකරණ භාෂණ පරිවර්තක, අධිකරණ ලඝු ලේඛක සහ අධිකරණ යතුරු ලේඛක) II වන ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය."

සැ. සැ.යු - ඉහත ප්‍රතිපාදන අනුව අධිකරණ ලඝු ලේඛක II වන ශ්‍රේණියේ නිලධරයන් සඳහා පැරණි සේවා ව්‍යවස්ථාව යටතේ පෙනී සිටීමට ලබාදුන් වසර තුනක සහන කාලය තුළ පවත්වනු ලබන මෙම විභාගය, ඒ යටතේ පවත්වනු ලබන 3 වන (අවසන්) විභාගය බව මෙයින් දන්වනු ලැබේ.

පී.එම්.ටී. බණ්ඩාර
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්

පී.එම්.ටී. බණ්ඩාර
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12.

අත්සන් කළේ / එච්.එස්.සෝමරත්න
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්

2023 ජනවාරි මස 11 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.

## SPECIMEN APPLICATION FORM

## Second Efficiency Bar Examination for Officers in Grade II of the Court Stenographer Service of Sri Lanka - 2020 (According to the old S.P.O.'s Service Minute)

01. Name:
    1:1 Name with initials Mr./Mrs./Miss:............................................................................................
    (In block capital letters)
    1:2 Full Name: ..................................................................................................................
    (In block capital letters)
    1:3 Full Name:..................................................................................................................
    (In Sinhala/Tamil)
    1:4 National Identity Card Number:..........................................................................................

02. Permanent Address:..........................................................................................................
    (In block capital letters)
    2:1 Permanent Address:......................................................................................................
    (In Sinhala/Tamil)
    2:2 Official Address:..........................................................................................................
    (In block capital letters)
    2:3 Official Address:..........................................................................................................
    (In Sinhala/Tamil)

03. Contact Details
    3.1 Mobile No-: ......................................................

04. Date of Birth: Date ___ Month ___ Year______

05. Personal File No: EA/PF/3/______

06. Medium in which you sit for the examination:

☐

(Denote with "S" for Sinhala, "T" for Tamil, "E" for English)

07. Please give details of the subjects and the years you sat for the exam previously:

| Year | Subject |
|---|---|
| | I.<br>II. |
| | I.<br>II. |

08. Subject / Subjects you are now offering to sit for:

    (i) ..................................................
    (ii) ..................................................

09. The value of payment made as examination fee:.............................

| Affix the receipt here. |
|---|

I state that the particulars given are accurate and I am entitled to sit for the examination in the medium mentioned in the paragraph 6 above. I certify that I am appearing for the examination for the first time / I have annexed the receipt obtained after making the appropriate payment. I agree to abide by the rules governing the examination.

............................ ....................................................

Date Signature of the applicant

---

**Attestation**

I hereby certify that Mr./Mrs./Miss..................................................................................................................

...........................................................who is a Grade II Court Stenographer is personally known to me and signed before me on ..................................................

..................................................

Signature of the Registrar

Date:......................................................

Name:....................................................

Designation:..........................................

Address:................................................

---

**Certificate of the Head of the Department**

I certify that,

01. The particulars furnished above were checked and found to be accurate.
02. The officer sits for this examination for the first time / has made the correct payment as examination fee.
03. The applicant is eligible to sit for this examination.

Designation:......................................

Date..................................................

.......................................................................

Signature of the Head of the Department